විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය
வெளிநாட்டு அலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சு
MINISTRY OF FOREIGN AFFAIRS, FOREIGN EMPLOYMENT AND TOURISM

**මාධ්‍ය නිවේදනය**

# <u>විදේශ කටයුතු අමාත්‍ය විජිත හේරත් තායිලන්තයේ නිල සංචාරයක</u>

තායිලන්ත කම්කරු අමාත්‍යවරයාගේ ආරාධනය පරිදි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය විජිත හේරත්, 2026 සැප්තැම්බර් 14 වැනි දින සිට 16 වැනි දා දක්වා තායිලන්තයේ නිල සංචාරයක නිරත වීමට නියමිතය.

මෙම සංචාරය අතරතුරදී, අමාත්‍ය හේරත්, තායිලන්ත කම්කරු අමාත්‍යවරයා, සංචාරක අමාත්‍යවරයා සහ වැඩබලන විදේශ කටයුතු අමාත්‍යවරයා සමඟ සාකච්ඡා පවත්වනු ඇති අතර, එහිදී අන්‍යෝන්‍ය වශයෙන් වැදගත් වන ක්ෂේත්‍රවල ද්විපාර්ශ්වික සහයෝගීතාව තවදුරටත් වර්ධනය කර ගැනීම කෙරෙහි අවධානය යොමු කෙරෙනු ඇත.

'කම්කරු සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම' සහ 'තායිලන්තයේ ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සේවයේ යෙදවීම පිළිබඳ එකඟතා ගිවිසුම' අත්සන් කිරීම මගින් දෙපාර්ශ්වයම කම්කරු ක්ෂේත්‍රයේ ද්විපාර්ශ්වික සහයෝගීතාව තවදුරටත් ශක්තිමත් කරනු ඇත.

මෙම සංචාරය මගින් සංචාරක හා රැකියා, සංක්‍රමණ සහ ශ්‍රමිකයන්ගේ සංචලතාව යන ක්ෂේත්‍රවල ප්‍රායෝගික සහයෝගීතාව වර්ධනය කිරීමටත්, ජනතාව අතර සබඳතා ශක්තිමත් කිරීමටත්, ශ්‍රී ලංකාව සහ තායිලන්තය අතර ද්විපාර්ශ්වික ආර්ථික සබඳතා වැඩිදියුණු කිරීමටත් අවස්ථාව සැලසෙනු ඇත.

**විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය**
**කොළඹ 01**

**2026 සැප්තැම්බර් 13 වැනි දින**

Foreign Affairs
විදේශ කටයුතු
வெளிநாட்டு அலுவல்கள்
Republic Building, Colombo 1
ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 1
குடியரசுக் கட்டிடம், கொழும்பு 1
☎ 2 325 373/5, 2 207 200/7
cypher@mfa.gov.lk

Foreign Employment
විදේශ රැකියා
வெளிநாட்டு வேலைவாய்ப்பு
17th Floor, "Mehewara Piyesa", Narahenpita, Colombo 5
17 වන මහල, "මෙහෙවර පියස", නාරාහේන්පිට, කොළඹ 5
17ஆவது தளம், "மெஹெவர பியெச", நாரஹேன்பிட்டி, கொழும்பு 5
☎ 2 331 200
info@mfe.gov.lk

Tourism
සංචාරක
சுற்றுலாத்துறை
No 03, Times Building, Bristol Street (Sir Razik Fareed Mw), Colombo 1
අංක 03, ටයිම්ස් ගොඩනැගිල්ල, බ්‍රිස්ටල් වීදිය (සර් රාසික් ෆරීඩ් මාවත), කොළඹ 1
இல.03, டைம்ஸ் கட்டிடம், பிரிஸ்டல் தெரு (சர் ராசிக் ஃபரீத் மாவத்தை) கொழும்பு 1
☎ 2 381 798, 2 321 222
secretary@tourismmin.gov.lk